**ඇමුණුම (1)**

අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කාන්තා ප්‍රඥප්තියෙන් මෙන්ම වෙනත් ජාත්‍යන්තර සම්මුතීන් හා වැඩසටහන් මගින් ප්‍රකාශිත අයිතිවාසිකම් තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට සමානාත්මතාව තහවුරු කිරීම උදෙසා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**1. ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම්**

- කාන්තා ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසිකම් තහවුරු කිරීමේ අරමුණින්
- කාන්තාවන් සඳහා පස් අවුරුදු ජාතික ක්‍රියාකාර සැලැස්ම ප්‍රකාර, අධ්‍යාපනික, සෞඛ්‍ය, ආර්ථික, දේශපාලනික, නීතිමය, පරිසර ආදී ක්ෂේත්‍ර මගින් කාන්තාවන් සවිබල ගැන්වීම.
- කාන්තා පිළිසරණ මධ්‍යස්ථානවලට අදාළ උපදෙස් මාලාවන් නිර්මාණය කිරීම සහ සීඩෝ සම්මුතිය (කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය - ශ්‍රී ලංකාව අනුමත කළ දිනය 1981.10.05) ප්‍රකාරව ඉටු කළ යුතු බැඳීම්හි ප්‍රගතිය විමසීම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයට වාර්තා කිරීම සිදු කරයි.

**2. පැමිණිලි මධ්‍යස්ථානය**

කාන්තා ප්‍රඥප්තිය මගින් ශ්‍රී ලංකා කාන්තාවන්ට ලැබිය යුතු යැයි සහතික කරන ලද අයිතිවාසිකම් කඩවීම පිළිබඳව සොයා බැලීමටත් එවැනි කඩවීම් වලින් අසාධාරණයට පත් පාර්ශවයන්ට සහන සලසා දීමේ අරමුණින් පිහිටුවන ලද පැමිණිලි මධ්‍යස්ථානය මගින් ගැටලු නිරාකරණයට අවශ්‍ය උපදෙස්, නීතිඥ සහාය, උපදේශනයට අවශ්‍ය සහාය ලබා දීම සහ වෙනත් සහාය අවශ්‍ය වන විට ඊට අදාළ ආයතන වෙත යොමු කිරීම සහ පසු විපරම් කටයුතු සිදුකිරීම.

**3. නීති සංශෝධනය**

සමාජයේ කාන්තාවන්ට සිදුවන යම් ආකාරයේ වෙනස්කම් පිටුදැකීම හා සම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ පෙරදැරිව ශක්තිමත් නීතිමය පිළිසරණක් ලබා දීම අරමුණු කර දැනට පවත්නා යම් යම් නීතිරීති සංශෝධනය සඳහා මැදිහත්වීම හා කාර්‍යකරණය සඳහා පියවර ගැනීම.

<u>අ. ඉඩම් සංවර්ධන ආඥා පනත</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කර රජයේ ඉඩම් පැවරීමේදී කාන්තාවන්ට සම අයිතීන් නිර්මාණය කර දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. දැනට ඉඩම් හිමි පියා මිය ගිය විට එම ඉඩමේ අයිතිය හිමිවන්නේ වැඩිමහල් පුත්‍රයාටය.

<u>ආ. විහාර හා දේවාලගම් පනත</u>

දියවඩන නිලමේ පත්කර ගැනීම සඳහා පවත්වනු ලබන ඡන්ද විමසීමේදී, ප්‍රාදේශීය ලේකම්වරයන්ටද ඡන්ද බලය ලබා දීමේ සාධාරණත්වය පෙන්නුම්කරදී එම පනතට අදාළ සංශෝධන ඇතුළත් කරන ලෙසට බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත යොමු කර ඇත.

<u>ඇ. අයාල ආඥා පනත</u>

කාන්තාවන්ට දැඩි දඬුවම් ලබාදී එම වරදට බැඳෙන පුද්ගලයාට ලිහිල් දඬුවම් ලබා දීමේ අසාධාරණත්වය මගහැරවීමට අවශ්‍ය නීති සම්පාදනය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ අවධානය යොමු කර ඒ සඳහා පත් කර ඇති කමිටුවට ජාතික කාන්තා කමිටුවේ සාමාජිකාවගේ සේවය ලබා ගන්නා ලෙස එම අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත.

**4. පර්යේෂණ / අධ්‍යයන**

කාන්තා ක්ෂේත්‍රයට අදාළ විෂයන් පිළිබඳ පර්යේෂණයන් හා අධ්‍යයනයන් දියත් කිරීම හා එහි නිර්දේශයන් හා යෝජනාවන් ක්‍රියාත්මක කිරීම

- කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමේදී ලංකාව මුහුණපාන බාධාවන් හා සීමාවන් හඳුනා ගැනීම සඳහා පර්යේෂණයක් දියත් කරන ලද අතර ඉන් මතුවූ කරුණු -

- දේශපාලනයේ කාන්තාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම
- බාල වයස් ගැබ් ගැනීම් තුරන් කිරීම
- කාන්තාවන්ට නීතිමය පිළිසරණක් ලබා දීමට පවත්නා යම් යම් නීතිරීති සංශෝධනය
- කාන්තා පිළිසරණ මධ්‍යස්ථාන පිහිටුවීම ආදී යෝජනාවන් පිළිබඳ ක්‍රියාත්මක වීම

**5. ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිංසනයන් වැළැක්වීම උදෙසා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් පැවැත්වීම**

අ. <u>කාන්තා හිංසනය වැළැක්වීම සඳහා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ යාන්ත්‍රණය සවිබල කිරීම උදෙසා වැඩසටහන් පැවැත්වීම</u>

කාන්තා හිංසනය හා අපචාර අවම කිරීම සඳහා ගෘහස්ථ හිංසන පනත යටතේ ගත යුතු ක්‍රියාමාර්ග හා කාන්තා අයිතිවාසිකම්, පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශ නිලධාරීන් සඳහා දිප ව්‍යාප්ත වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. 2011 වර්ෂයේ වැඩසටහන් 5ක් දියත් කර ඇත.

ආ. <u>කාන්තාවන්ට සිදුවන හිංසනය වැළැක්වීමේ අන්තර් ජාතික දින 16 වැඩසටහනට සමගාමීව ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් පැවැත්වීම</u>

කාන්තාවන්ට සිදුවන හිංසනය වැළැක්වීමේ අන්තර් ජාතික දිනයට සමගාමීව විවිධ හිංසනයන්ට භාජනය වන කාන්තාවන් මුදවා ගැනීමේ අරමුණින් හා එවැනි සිද්ධීන් මුලිනුපුටා දැමීමේ පරමාර්ථයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මෙකී වැඩමුළු 2008, 2009, 2010 හා 2011 වර්ෂයන්හිදී ද ක්‍රියාත්මක කරන ලදි.

| පැවැත්වූ වර්ෂ | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| පැවැත්වූ දිස්ත්‍රික්ක | 12 | 2 | 9 | 5 |
| ප්‍රදේශීය ලේ. කො. ගණන | 182 | 28 | 89 | 74 |
| සහභාගී වූ සංඛ්‍යාව - ස්ත්‍රී | | 1299 | | 4732 |
| පුරුෂ | | 823 | | 3993 |

ඇ. <u>2005 අංක 34 දරණ ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත පිළිබඳ කටයුතු කිරීම</u>

- 2005වර්ෂයේදී සම්මත කරගන්නා ලද අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත පිළිබඳ පොලිස් නිලධාරීන්, උපදේශන නිලධාරීන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් 2008 වර්ෂයේදී පැවැත්වීම
- එම පනත ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පිළිබඳ වැඩමුළුවක් 2008 වර්ෂයේදී පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග පැවැත්වීම හා ඉන් මතුවූ කරුණු අනුව කටයුතු කිරීම
- එමෙන්ම මහේස්ත්‍රාත් විනිසුරුවරුන් සම්බන්ධ කරගත් වැඩමුළුවක් 2008 වර්ෂයේදී විනිසුරුවරුන්ගේ ආයතනය සමග ඒකාබද්ධව පවත්වන ලදී.

ඇ. <u>විදේශ ගත වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ ගැටලු අවම කිරීම සඳහා කටයුතු කිරීම</u>

විදේශ ගතවන කාන්තාවන්ගේ ගැටලු අවම කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, විදේශසේවා නියුක්ති කාර්යාංශය හා විදේශ රැකියා නියෝජිත ආයතන සමග ජාලගතව කටයුතු කිරීම. මාසික හා ත්‍රෛමාසික සාකච්ඡා පවත්වා විදේශ ගතවන කාන්තාවන්ට උප ඒජන්තවරුන්ගෙන් ඇතිවන ගැටලු, කාන්තාවන් වෛද්‍ය පරීක්ෂණ වලට යොමුවීමේදී ඇතිවන ගැටලු ආදිය පිළිබඳ කටයුතු කරගෙන යනු ලැබේ.

ඉ. <u>කාන්තා හිංසනය වැළැක්වීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා වැඩමුළු පැවැත්වීම හා අදාළ යෝජනා ලබා ගැනීම</u>

කාන්තාවන්ට සිදුවන හිංසනය වැළැක්වීම සඳහා නිවැරදි හා සඵලදායී නිර්ණායක හඳුනාගෙන නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපත්ති තලයේ වැඩමුළු පැවැත්වීම. ප්‍රධාන වශයෙන් අනුරාධපුරය, හම්බන්තොට හා කෑගල්ල යන දිස්ත්‍රික්කවන්හි 2010 වර්ෂයේදී වැඩසටහන් 3ක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

ඊ. <u>කුට්ටනය (මිනිස් වෙළඳාම) වැළැක්වීම සඳහා වැඩසටහන් පැවැත්වීම</u>

කාන්තා ප්‍රඥප්තියෙන් මෙන්ම වෙනත් ජාත්‍යන්තර සම්මුතීන් හා වැඩසටහන් මගින් ප්‍රකාශිත අයිතිවාසිකම් තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන කාන්තා කුට්ටනය (මිනිස් වෙළඳාම) තුරන් කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා සංවිධාන සමග ප්‍රතිපත්තිමය වැඩසටහනක් 2010 වර්ෂයේදී ශ්‍රී ලංකා පදනම් ආයතනයේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරානි තිලකවර්ධන මැතිණියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

උ. <u>බස් රථවල කාන්තාවන් සඳහා ආසන පේළියක් වෙන් කිරීම</u>

බස් රථයෙන් ගමන් කරන කාන්තාවන් හා පාසල් දැරියන් නිබඳ විවිධ තාඩන පීඩන හා හිංසනයන්ට පත්වන බැවින් යම්තාක් දුරට හෝ මෙම හිංසනයන් මග හැරවීමට මෙන්ම මාතෘත්වයේ නාමයෙන් කාන්තාවන්ට සාදාචාරාත්මකව බස් රථයෙහි ගමන් කිරීමට පහසුවීම සඳහා කාන්තාවන් සඳහා වූ ආසන පේළියක් වෙන් කරන ලෙස පුද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශයෙන් හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් ඉල්ලීම් කර ඇත.

ඌ. <u>ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු අවම කිරීම සඳහා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම</u>

<u>i. මාධ්‍ය වැඩමුළු දියත් කිරීම</u>

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය පිළිබඳව මාධ්‍යයෙහි වාර්තා කිරීම පිළිබඳව වන ආචාරධර්ම ප්‍රතිපත්ති ගොඩනැගීම, මාධ්‍ය තුළ ධනාත්මක කාන්තා ප්‍රතිරූපයක් ගොඩ නැගීමට පෙළඹවීම. මේ සඳහා තිර රචකයින් සමග සාකච්ඡා පැවැත්වීම

<u>ii. පොත්පත්, පත්‍රිකා, පොස්ටර්, ස්ටිකර් මුද්‍රණය කිරීම</u>

පොදු ප්‍රවාහන සේවාවලදී කාන්තාවන්ට සිදුවන හිංසන අවම කිරීමට ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් පොදු ප්‍රවාහන සේවාවන් වෙත බෙදාහැරීම සඳහා ස්ටිකරයක් නිර්මාණය කර බෙදා හරින ලදී.

ගෘහස්ථ හිංසනය වැළැක්වීම උදෙසා ද පෝස්ටරයක් නිර්මාණය කර බෙදා හරින ලදී.

<u>iii. විත්‍රපට නිෂ්පාදනය හා විකාශනය කිරීම</u>

කාන්තා ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත අයිතිවාසිකම් තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන, කාන්තාවන්ට සිදුවන හිංසනය අවම කිරීමේ අරමුණින් "පුංචි කැදැල්ලයි සතුටු සිනහවයි"වාර්තා විත්‍රපටයද, කාන්තාවන්ට අහිතකර සමාජ ආකල්ප වෙනස් කිරීම පිළිබඳව නිෂ්පාදනය කරන ලද "අඳුර විනිවිද", වාර්තා විත්‍රපට නිෂ්පාදනය කර විකාශනය කිරීම.

එමෙන්ම මගතොටදී කාන්තාවන්ට වන හිංසනය පිළිබඳව නිෂ්පාදනය කරන ලද "යක්කු සිටිති මහපාරේ" යන කෙටි වාර්තා විත්‍රපටියද නිෂ්පාදනය කර විකාශනය කර ඇත.

මෙම වාර්තා විත්‍රපට අතිශයින් දුෂ්කර ගම්මානවල ජනයා උදෙසා ද දර්ශනය කරවීම විශේෂයෙන්

අනුරාධපුරය -කැබිතිගොල්ලෑව, හෝරුපත්දෙනාව, පදවිය

හම්බන්තොට - ලුණුගම් වෙහෙර, වලස්මුල්ල,

මාතර - රොටුඹ, උරුබොක්ක හා

කෑගල්ල - දැරණියගල, යටියන්තොට යන වතු ප්‍රජාව උදෙසා ද මෙම වාර්තා විත්‍රපට දර්ශනය කර ඇත.

මෙමගින් මාතෘත්වය අගයන සමාජයක් පවත්වාගෙන යාමේ මහඟු වැදගත්කම ජනතාව අතරට රැගෙන යාම ප්‍රධාන අරමුණයි.

<u>iv. රූපවාහිනී හා ගුවන් විදුලි සාකච්ඡා පැවැත්වීම</u>

මුළු දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන් ප්‍රචාරය කිරීම. එමගින් යහපත් සාමකාමී සහජීවනයෙන් හෙබි සමාජ වටපිටාවක් මුළු දිවයින පුරා ගොඩනැගීමේ පරමාර්ථයෙන් මෙම වැඩසටහන් දියත් කර ඇත.

එනම් කාන්තාව හා සාමය, ගෘහස්ථ හිංසනය වැළැක්වීම, දරුවාගේ මානසික සංවර්ධනයට මවගේ දායකත්වය, කාන්තාව හා දේශපාලනය, කාන්තාවන් රැකියා සඳහා විදේශ ගතවීමේ ප්‍රතිවිපාක, පැමිණිලි මධ්‍යස්ථානයේ කාර්යභාරය ආදිය මෙම වැඩසටහන් පැවැත්වූ මාතෘකා අතුරින් කිහිපයකි.

උතුරු නැගෙනහිර දෙමළ භාෂාව කථා කරන ජනයා උදෙසා දෙමළ මාධ්‍යයෙන් වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත.

**6. දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩිකිරීම උදෙසා වැඩසටහන් දියත් කිරීම**

<u>මාධ්‍ය මගින් පෙළඹවීම් සිදුකිරීම</u>

දේශපාලනයේ කාන්තා දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින්, විද්‍යුත් මාධ්‍ය මගින් වැඩසටහන් දියත් කරන ලදි.

විශේෂයෙන්ම "හෙට අලුත් දවසක්", "දිරිය දෝණි" වැනි වාර්තා චිත්‍රපට නිෂ්පාදනය කර ජාතික රූපවාහිනී නාලිකා ඔස්සේ මහජනයා උදෙසා විකාශනය කරන ලදී. දෙමළ භාෂාව කථා කරන ජනතාව උදෙසා, දෙමළ උපසිරැසි සමග ද වාර්තා චිත්‍රපට නිෂ්පාදනය කර ඇත.

<u>"කාන්තාව හා දේශපාලනය" එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව</u>

දේශපාලනයේ කාන්තාව දිරිගැන්වීම සඳහා සමාජ හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ, ජාතික සමාජ සංවර්ධන ආයතනය හා එක්ව සිංහල මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවක් 2011 ආරම්භ කර ලද අතර කාන්තාවන් 17 දෙනෙක් මෙම පාඨමාලාව සතුටුදායක ලෙස අවසන් කර ඇත.

මෙම පාඨමාලාව වාර්ෂිකව පවත්වනු ලබන අතර දෙමළ මාධ්‍ය පාඨමාලාව උතුරු නැගෙනහිර පාදක කර ආරම්භ කිරීම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

**7. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ පරිදි ඉන්දීය සම්භවයකින් යුතු වතු ප්‍රජාව හා උතුරු නැගෙනහිර ප්‍රජාව පාදක කර වැඩසටහන් මාලාවක් 2013 වර්ෂයේදී ආරම්භ කර ඇත. එනම්,**

- බාලවයස්කාර ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන සහ නව යොවුන් වියේ ගැහැණු දරුවන්ගේ ජීවන කුසලතා හා ප්‍රජනන සෞඛ්‍ය දියුණු කිරීමේ වැඩසටහන්

2012 වර්ෂයේදී මඩකලපුවේ වැඩසටහන් 3ක්ද, තංගල්ල, කෑගල්ල, තලාව, කැබිතිගොල්ලෑව යන ස්ථානවල වැඩසටහනක් බැගින් ද, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙනුවෙන්, මහරගම පිළිකා ආයතනයේදී තවත් වැඩමුළුවක්ද පවත්වන ලදී. 2013 වර්ෂයේදී මෙවැනි වැඩසටහන් 7ක් පැවැත්වීමට නියමිතය.

- UNSCR 1325 ක්‍රියාත්මක කිරීම
  කාන්තා ආරක්ෂාව, කාන්තාවන්ට හිරහැර කිරීම, කාන්තා අයිතිවාසිකම්, නීතිය ක්‍රියාත්මක කිරීම යනාදි කාරණා පිළිබඳව අධිකාර නිලලත් පොලිස් නිලධාරීන් සහ සන්නද්ධ සේවා සාමාජිකයින් දැනුවත් කිරීම හා ඒ පිළිබඳ ඔවුන් සතු දැනුම යාවත්කාලීන කිරීම.

ඒ සඳහා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී හා කිලිනොච්චියේදී සම්මන්ත්‍රණ දෙකක් පවත්වනු ලැබිය. 2013 වර්ෂයේ ත්‍රිකුණාමලයේ දී වැඩසටහනක් පවත්වන ලදි.

මේ ආකාරයෙන් විශේෂයෙන් එල්. ටී. ටී. ඊ ග්‍රහණයට නතුවූ උතුරු නැගෙනහිර කාන්තා ප්‍රජාවේ සුභ සාධනය උදෙසා ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීමට, ළමා සහ කාන්තා අභිවෘද්ධිය වෙනුවෙන් සක්‍රිය වැඩසටහන් නිබඳව පැවැත්වීමට අමාත්‍යාංශය හා ජාතික කාන්තා කමිටුව ක්‍රියා කරනු ඇත.

**ඇමුණුම් (2)**

| වැඩසටහන් | වෙන් කළ මුදල (රු. මිලියන) | | | |
|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 |
| වාර්ෂික ප්‍රතිපාදන | **6.0** | **3.4** | **3.0** | **5.0** |
| 1. ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් | 0.075 | 0.3 | - | 0.2 |
| 2. පැමිණිලි මධ්‍යස්ථානය | - | - | - | - |
| 3. නීති සංශෝධනය | 0.055 | - | - | - |
| 4. පර්යේෂණ / අධ්‍යයන | 0.505 | - | 0.36 | 0.45 |
| 5. ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිංසනයන් වැළැක්වීම උද්දේශනාත්මක වැඩසටහන් පැවැත්වීම (Advocacy Programmes) | | | | |
| i. කාන්තා හිංසනය වැළැක්වීම සඳහා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ යාන්ත්‍රණය සවිබල කිරීම උදෙසා වැඩසටහන් පැවැත්වීම | - | 0.05 | - | 0.1 |
| ii. කාන්තාවන්ට සිදුවන හිංසනය වැළැක්වීමේ අන්තර් ජාතික දින 16 වැඩසටහනට සමගාමීව ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් පැවැත්වීම | 0.875 | 0.7 | 1.33 | 1.0 |
| iii.2005 අංක 34 දරණ ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත පිළිබඳ කටයුතු කිරීම | 0.15 | 1.0 | - | 0.2 |
| iv.විදේශ ගත වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ ගැටලු අවම කිරීම සඳහා කටයුතු කිරීම | 0.05 | 0.05 | - | - |
| v. කාන්තා හිංසනය වැළැක්වීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා වැඩමුළු පැවැත්වීම හා අදාළ යෝජනා ලබා ගැනීම | - | - | 0.25 | 0.3 |
| vi. කූට්ටනය (මිනිස් වෙළඳාම) වැළැක්වීම උදෙසා වැඩසටහන් පැවැත්වීම | - | - | 0.2 | - |
| 8. ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටලු අවම කිරීම සඳහා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම | | | | |
| 1.මාධ්‍ය වැඩමුළු දියත් කිරීම | 0.25 | | 0.2 | 0.3 |
| 2.පොත්පත්, පත්‍රිකා, පෝස්ටර් මුද්‍රණය කිරීම | 0.285 | 0.15 | 0.15 | |
| - | | | | |
| 3.චිත්‍රපට නිෂ්පාදනය හා විකාශනය කිරීම | 1.2 | 0.175 | - | 0.3 |
| 4.රූපවාහිනී හා ගුවන් විදුලි සාකච්ඡා පැවැත්වීම | 0.786 | 0.15 | 0.15 | 0.4 |
| 9. දේශපාලනයේ කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීම | | | | |
| -මාධ්‍ය මගින් පෙළඹවීම් | 0.25 | 0.075 | 0.2 | - |
| - දේශපාලන ඩිප්ලෝමාව | - | - | - | |